සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

අවසාන වාර පරීක්ෂණය - 2025
இறுதி தவணைப் பரீட்சை - 2025 / Year End Term Test - 2025

ශ්‍රේණිය / தரம் / Grade	කාලය / நேரம் / Time
10 ශ්‍රේණිය	පැය 03යි

කතෝලික ධර්මය I

නම / பெயர் / Name ..... විභාග අංකය / சுட்டிலக்கம் / Index No. .....

- **අංක 01 සිට 40 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරන්න.**

01. දේව අනාවරණයේ ලිඛිත මූලාශ්‍රය වන්නේ මින් කුමක්ද?
(1) ජීවන සහා සම්ප්‍රධාය (2) ශුද්ධ බයිබලය
(3) මහෝපදේශය (4) කතෝලික සහා ධර්මෝපදේශය

02. පුරාණ ගිවිසුමේ පොත් වර්ගීකරණයට අනුව ප්‍රඥා සාහිත්‍යයට අයත් පොතක් නොවන්නේ,
(1) ජෝබ් (2) ගීතාවලිය (3) මලාකි (4) සිරාක්

03. සීනයි ගිවිසුමට හෙවත් දස පනතට අනුව ජීවත් වන තරමට අපට ද දේවාශිර්වාදය හිමිවන බව පෙන්වා දෙන පොත් කාණ්ඩය වනුයේ,
(1) ජෝෂුවා සිට 2 රාජාවලිය දක්වා පොත් (2) රූත් කතාව හා එස්තර් කෘති
(3) එස්රා හා නෙහෙමියා පොත් (4) නික්මයාම

04. "මේ පොතෙහි ලියා නැති වෙනත් බොහෝ හාස්කම් ජේසුස් වහන්සේ සිය ශ්‍රාවකයන් ඉදිරියෙහි සිදු කළ සේක" මෙසේ සාක්ෂි දරණ සුවිශේෂක කතුවරයා,
(1) ශුද්ධවූ මාක් (2) ශුද්ධවූ මතෙව් (3) ශුද්ධවූ ජොහාන් (4) ශුද්ධවූ ලුක්

05. දෙවියන් වහන්සේගේ මිත්‍රයා යන අර්ථය දරණ නාමය වනුයේ මින් කුමක්ද?
(1) ලුක් (2) ෂාලොම් (3) ජොහාන් (4) තියෝපිලස්

06. අපෝස්තලික යුගයේදී ශුද්ධ වූ සභාවට මහඟු සේවයක් කළ විශිෂ්ට පුද්ගලයෙකු වන්නේ,
(1) ශුද්ධවූ පාවුළු තුමා (2) ශුද්ධවූ පේදුරු තුමා
(3) ශුද්ධවූ ස්තේපන් තුමා (4) ශුද්ධවූ මතියස් තුමා

07. එළිදරව් සාහිත්‍යයේ ලක්ෂණයකි,
(1) ද්විත්වවාදය (2) යුගාන්තවාදය (3) සංකේත භාවිතය (4) ඉහත කී සියල්ලම

08. වර්ණ සංකේත : A- සුදු B - රතු C- කළු D - සුදුමැලි
සංඛ්‍යා සංකේත : A - 4 B - 7 C - 10 D - 12
පහත දැක්වෙන ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර තේරීමට දී ඇති වර්ණ හා සංඛ්‍යා සංකේත භාවිත කරන්න.
ජයග්‍රහණය හා විශ්වය නිවැරදිව දැක්වෙන පිළිතුර කාණ්ඩය වනුයේ කුමක්ද?
(1) A, A (2) A, B (3) AD (4) BB

Past Papers Wiki

09. මරණය පරිපූර්ණත්වය හා ඉශ්‍රායෙලය / දේව ජනතාව දැක්වෙන නිවැරදි පිළිතුර සඳහන් වරණය කුමක්ද?

(1) $A, C. D$ (2) A, A, C (3) D, C, D (4) D, A, C

10. දීර්ඝායුෂවත්, ධන සම්පත් වත් සතුරන්ගේ ජීවිතය වත් ඉල්ලන්නේ නැතිව විනිශ්චය තේරුම් ගැනීමට ඥානය පමණක් දෙවියන් වහන්සේගෙන් ඉල්ලූ රජතුමා වූයේ,

(1) දාවිත් රජ (2) සලමොන් රජ (3) සාවුල් රජ (4) හෙරොද් රජ

11. ජීවිත හරය, එහි ගැටලු විනිශ්චය පිළිබඳ සංකල්පනා ආශ්‍රිතව කෙරෙන විග්‍රහයකි.

(1) පවුල හා ගෝත්‍රික ප්‍රඥාව (2) රාජ්‍ය සභා ප්‍රඥාව
(3) අභිධාර්මික ප්‍රඥාව (4) ඒදිනෙදා ජීවිතය සම්බන්ධ ප්‍රඥාව

12. ජුදයන් අතට පාවා දීමෙන් අනතුරුව ජේසුස් වහන්සේව රැගෙන යන්නේ,

(1) ජුදා ශ්‍රේෂ්ඨාධිකරණයට (2) පිලාත් ආණ්ඩුකාරයා වෙත
(3) හෙරොද් ඇන්ටිපස් වෙත (4) උත්තම පූජකයාගේ මැදුර වෙත

13. තෙවන ධර්මදූත චාරිකාවෙන් පසු ශුද්ධ පාවුලු තුමා නැවතී සිටියේ,

(1) ජෙරුසලමේ (2) ලුස්ත්‍රාව (3) දර්බය (4) සයිප්‍රසය

14. අපෝස්තුලුවරුන් වෙත ජේසුස් වහන්සේ පව්කමා කිරීමේ බලය දානය කරනු ලැබුවේ,

(1) පාස්කු ඉරුදින (2) මහ බ්‍රහස්පතින්දා
(3) මහ සිකුරාදා (4) අලේලුයියා සෙනසුරාදා

15. ජුදා ආගමිකයන් දෙවියන් වහන්සේට තුතිදීමේ මංගල්‍යයක් ලෙස සමරනු ලැබුවේ,

(1) පාස්කු මංගල්‍යය (2) පෙන්තකොස්ත මංගල්‍යය
(3) නික්මයාම (4) නත්තල් මංගල්‍යය

16. මුල් කිතුනු සභාවේ ලක්ෂණයක් නොවන්නේ මින් කුමක්ද?

(1) ප්‍රේරිතයන්ගේ ඉගැන්වීම (2) සහභාගීකම (3) කතෝලිකත්වය (4) යාච්ඤාව

17. මුල් කිතුනු සංඝය තුළ ද ප්‍රේමය හා සේවය අතපසු කරමින් දිව්‍ය සත්ප්‍රසාදීය භෝජනයට සහභාගී වී ඇති බවත් එසේ කිරීම නුසුදුසු බවත් ශුද්ධ පාවුලු තුමා පෙන්වා දුන් සභාව,

(1) කොරෙන්ති (2) එපීස (3) ගලාති (4) රෝම

18. පුරාණ ගිවිසුමේ වන්දනාවේ කේන්ද්‍රීය ක්‍රියාව වනුයේ 10/55

(1) දිව්‍ය පූජාව පැවැත්වීම (2) යාග පූජා පුද කිරීම
(3) ධ්‍යානයට සම වැදීම (4) දේශනා කිරීම

19. "බලාපොරොත්තුවේ එළිපත්ත" නම් කෘතිය රචනා කරනු ලැබුවේ,

(1) ශුද්ධවූ මැක්සිමිලියන් කෝල්බේ මුනිතුමා (2) ශුද්ධවූ දෙවන ජුවාම් පාවුලු මුනිතුමා
(3) කුරුසියේ ජුවාම් තුමා (4) අවිලාහි ශුද්ධවූ තෙරේසා තුමිය

20. යාග පැවැත්වීමේ පරමාර්ථයක් වන්නේ,

(1) පව් වලට වන්දි ගෙවීම සඳහා
(2) දෙවියන් සමග යහපත් සම්බන්ධතාවයක් පවත්වා ගැනීමට
(3) දෙවියන් සමඟ අඛණ්ඩ සම්බන්ධතාවයක් පවත්වා ගැනීමට
(4) ඉහත කී සියල්ලම

21. කිතුනුවකු ලෙස කිතුනුකමට සාක්ෂි නොදැරීමෙන් කඩවන පනත වනුයේ,
(1) හත් වන පනත (2) අටවන පනත
(3) දෙවන පනත (4) පළමුවන පනත

22. ශුද්ධවූ පාවුලු තුමා දරුවන්ට හා දෙමාපියන්ට අවවාද කරනුයේ කුමන ලිපියෙන්ද?
(1) එපීස ලිපිය (2) ගලාති (3) කොරින්ති (4) රෝම

23. ★ පොදු දේපළ විනාශ කිරීම
★ සාමය වෙනුවෙන් ඉදිරිපත් නොවීම
★ අසභ්‍ය වචන භාවිතය
ඉහත පාපයන් නිසා කඩ වන පනත් පිළිවෙළින් දක්වා ඇති පිළිතුර අඩංගු වරණය වන්නේ,
(1) 4,5,6,9 පනත් (2) 5,4,9,6 පනත් (3) 10,1,6,9 පනත් (4) 5,6,4,9 පනත්

24. මල් උයනේ යාච්ඤාව (මාක් 14: 32 - 42) මගින් අපට ඉදිරිපත් කරන ප්‍රබල පණිවිඩය වන්නේ,
(1) ජේසුස් වහන්සේගේ දුක් ප්‍රාප්තියේ භයංකාරකම
(2) ජීවිතයේ අසීරු කාල වලදී පමණක් දෙවියන්ට ළං විය යුතු බව
(3) ජීවිතයේ සෑම අවස්ථාවකටම යාච්ඤාවෙන් සූදානම් විය යුතු බව
(4) මරණ මොහොතේදී යැදුමෙන් එයට සූදානම් විය යුතු බව

25. කතෝලික සභාව පිළිගත් සභාවක් නොවන්නේ මින් කුමක්ද?
(1) ලංකා සභාව (2) දකුණු ඉන්දියානු සභාව
(3) බැප්ටිස්ට් සභාව (4) ගැලවීමේ හමුදාව

26. ස්ත්‍රෝත්‍ර යාගික පිළිවෙතෙහි ප්‍රධාන කොටස් තුනට අයත් නොවන්නේ,
(1) ස්ත්‍රෝත්‍ර යාගික යැදුම
(2) පොදු යැදුම
(3) ස්වාමීවාක් ආරාධනාව, සාමය පැතීම හා පූප කැඩීම
(4) දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ දානය කිරීම හා බොදුනෙත් පසු යැවුම

27. ජන වන්දනා වසර තුළ ආගමන සමය හා චතාරික සමය තුළ භාවිතා කරන වර්ණය වන්නේ,
(1) සුදු (2) රතු (3) කොළ (4) දම්

28. "දෙවියන් වහන්සේගේ මධ්‍යස්ථකයාණෙ" යන විශ්ව ලේඛනය කරනු ලැබුවේ,
(1) අති උතුම් XII වන පියුස් ශුද්ධෝත්තම පියතුමා
(2) අති උතුම් IV වන ලියෝ ශුද්ධෝත්තම පියතුමා
(3) අති උතුම් I වන පාවුලු ශුද්ධෝත්තම පියතුමා
(4) අති උතුම් II වන ජුවාම් පාවුලු ශුද්ධෝත්තම පියතුමා

29. තම වරද අන් අය පිට පැටවීමෙන් කඩවන පනත වනුයේ,
(1) හත්වන පනත (2) අටවන පනත (3) දසවන පනත (4) පස්වන පනත

30. ස්වාමීන්ගේ ආත්මයාණන් පරීක්ෂා කරන්නට ඔබ දෙපොල එකඟ වූයේ කෙසේද?
(1) එළිසබෙත් හා සකරියස් (2) අනනියස්, සපීරා
(3) ආබ්‍රහම්, සාරා (4) ඊසාක්, රෙබෙකා

31. තමාටත් අසල්වැසියන්ටත්, දෙවියන් වහන්සේටත් විරුද්ධ ව කරන පාපයක් වනුයේ,
(1) ගබ්සාව (2) සමලිංගික විවාහ (3) සිය දිවි නසා ගැනීම (4) බොරු කීම

32. මිනිසා තුළ ඇති ඊර්ෂ්‍යාව, ක්‍රෝධය හා පිළිගැනීම වැනි ජන්ම පාපී ප්‍රතිඵල ලෝක ආරම්භයේ සිට ම ක්‍රියාත්මක වූ බව දක්වන සිද්ධිය වූයේ,
(1) කායින් ආබෙල් ඝාතනය කිරීම
(2) ආදම් සහ ඒව පව් කිරීම
(3) ජෝසප්ව තම සොයුරන් විකිණීම
(4) සාතන් විසින් ඒව පාපයට පොළඹවා ගැනීම

33. දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ස්ථාපිත කිරීම, පූජක වරය ස්ථාපිත කිරීම හා අපෝස්තුලුවරුන්ගේ පාද දෝවනය කරනු ලැබුවේ,
(1) මහ සිකුරාදා දින (2) මහ බ්‍රහස්පතින්දා දින
(3) අළු බදාද දින (4) පාස්කු ඉරු දින

34. දිව්‍ය පූජාවේදී දක්නට ලැබෙන මුලසුනේ යැදුමට අයත් වන්නේ,
(1) පොදු යැදුම (2) පඬුරු මත යැදුම
(3) බොදුනෙන් පසු යැදුම (4) ඉහත සියල්ලමය

35. වැඩිහිටි ප්‍රසාද ස්නාපනය ලැබීමට අපේක්ෂාවෙන් සිටින්නන්ව සූදානම් කරන අවසාන කාලය
(1) චතාරික සමය (2) ආගමන සමය (3) නත්තල් සමය (4) පාස්කු සමය

36. මරියතුමියගේ ජන්ම දෝෂයෙන් නිර්දෝෂව පිළිසිඳ ගැනීමේ මංගලෝත්සවය සමරනු ලබන්නේ,
(1) ජනවාරි 01 (1) අගෝස්තු 15 (3) දෙසැම්බර් 08 (4) සැප්තැම්බර් 8

37. තමාගේ සහෝදරයාට මෝඩයා කියා ගරහන අයට අත්වන ඉරණම කුමක්ද?
(1) නිරා ගින්නට ගොදුරු වීම (2) ශ්‍රේෂ්ඨාධිකරණයට යටත් වීම
(3) මහාධිකරණයට යටත් වීම (4) විනිශ්චයට ලකම්ම

38. නුඹේ මුළු..... ද නුඹේ මුළු ආත්මයෙන්ද නුඹේ මුළු ..... ද නුඹේ මුළු බුද්ධියෙන්ද නුඹේ දෙවි වූ සමිදාණන් වහන්සේට ප්‍රේම කරන්න. (ලූක් 10:27) සඳහන් පාඨයෙහි හිස් තැනට සුදුසු වචන පිළිවෙළින් දක්වනු ලබන පිලිතුර වනුයේ,
(1) හෘදයෙන් ද, වීර්යයෙන්ද (2) වීර්යයෙන් ද, ශක්තියෙන්ද
(3) ශක්තියෙන් ද, හෘදයෙන්ද (4) හෘදයෙන් ද, කැමැත්තෙන්ද

39. සියලු යාග සම්පූර්ණත්වයට පත් වූයේ,
(1) ගිවිසුම් කරඬුව මගිනි (2) කල්වාරි යාගය මගින්
(3) රතු මුහුදු තරණය මගින් (3) දිව්‍ය පූජා යාගය මගින්

40. 1948 දී ශ්‍රී ලංකාවට නිදහස ලැබීමෙන් පසු කතෝලික සභාව මුහුණදුන් ප්‍රධානම ගැටලුව වූයේ,
(1) 1960 විදේශීය ධර්මදූතයන්ගේ වීසා අළුත් නොකිරීම
(2) කතෝලික පරිසරය කතෝලික පාසල් වලින් ගිලිහීම
(3) 1961 පාසල් රජයට පවරා ගැනීම
(4) ආගම ඉගැන්වීම සතියකට කාලච්ඡේද 2 කට සීමාවීම.

(1x40=40)

Past Papers Wiki

සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

අවසාන වාර පරීක්ෂණය - 2025
இறுதி தவணைப் பரீட்சை - 2025 / Year End Term Test - 2025

ශ්‍රේණිය / தரம் / Grade: 10 ශ්‍රේණිය	**කතෝලික ධර්මය - II**	කාලය / நேரம் / Time:

නම / பெயர் / Name: ..... විභාග අංකය / சுட்டிலக்கம் / Index No: .....

- **පළමු ප්‍රශ්නය ඇතුළුව තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු ලියන්න.**

01. 1. දේව අනාවරණයේ මූලාශ්‍ර දෙක ලියන්න.
2. ආරූඪ කර්තෘත්වයෙන් යුතු හසුන් දෙකක් නම් කරන්න.
3. ප්‍රඥා සාහිත්‍යයට අයත් ග්‍රන්ථ 2 ක් නම් කරන්න.
4. ජේසුස් වහන්සේගේ උත්ථානයෙන් පසු ශ්‍රාවකයන්ට දර්ශනය වූ අවස්ථා 2 ක් නම් කරන්න.
5. ජේසුස් වහන්සේ මනුෂ්‍ය පුත්‍රයාණෝ කවරෙක් ය කියා මිනිසුන් කියත් දැයි සිය ශ්‍රාවකයන්ගෙන් ඇසූ ප්‍රශ්නයට පේදුරු තුමා දුන් පිළිතුර කුමක්ද?
6. ශුද්ධ වූ සභා නායකත්වයට පත්කළ පේදුරු තුමාට හිමි වූ විශේෂ බලතල අතරින් 2 ක් දක්වන්න.
7. දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ පිළිබඳ පූර්ව සලකුණු දෙකක් දක්වන්න.
8. මයිදාව ඇති ව දිවි ගෙවන්නට කළ හැකි ක්‍රියාකාරකම් දෙකක් ලියන්න.
9. ශුද්ධ වූ සතියේ ප්‍රධාන ජන වන්දනා දිනයන් දෙකක් නම් කරන්න.
10. කිතුනු සභා ප්‍රධාන වශයෙන් බෙදෙන කොටස් දෙක නම් කරන්න.

(2x10=20)

02. 1. ශුද්ධවූ පාවුළු තුමා ලිපි (හසුන්) ලිවීමේ පරමාර්ථ 2 ක් නම් කරන්න. (ල. 02)
2. ශුද්ධවූ පාවුලු තුමාගේ හසුන් වර්ග කළ හැකි ආකාර 3 දක්වන්න. (ල. 03)
3. දෙවියන් වහන්සේගේ මිතුරෙකු වී ජේසුස් වහන්සේ පිළිබඳ සුබාරංචිය අන් අය වෙත ගෙන යා හැකි ආකාර 5 ක් විස්තර කරන්න. (ල. 05)

03. 1. ප්‍රඥා සාහිත්‍යයට අයත් ග්‍රන්ථ 2 ක් නම් කරන්න. (ල. 02)
2. ප්‍රඥාව ඉදිරිපත් කර ඇති සාහිත්‍යමය ස්වරූප 3 ක් නම් කරන්න. (ල. 03)
3. දේව දරුවෙකු ලෙස ප්‍රසාද ස්නාපනීය කැඳවීම තුළ නිවස, පාසල හා සමාජය තුළ ඔබට කළ හැකි යහපත් ක්‍රියා 5 ක් විස්තර කරන්න. (ල. 05)

PAST PAPERS WIKI

Past Papers Wiki

04. 1. බ්‍රිතාන්‍ය යුගයේදී මෙරටට පැමිණි පැවිදි නිකායන් දෙකක් නම් කරන්න. (ල. 02)

2. ශුද්ධ ජුසේවාස් පියතුමා කළ ප්‍රාතිහාර්ය 3 ක් නම් කරන්න. (ල. 03)

3. සැබෑ ක්‍රිස්තු අනුගාමිකයෙකු ලෙස ක්‍රිස්තුස් වහන්සේව අන් අයට හඳුන්වා දීමට ඔබට කටයුතු කළ හැකි ආකාර 5 ක් ලියා විස්තර කරන්න. (ල. 05)

05. 1. දිව්‍ය පූජා යාගය සිදු කිරීමේ ප්‍රධාන අරමුණු 2 ක් ලියන්න. (ල. 02)

2. ඉරුදින ශුද්ධවත්ව යාග කිරීම සඳහා කළ හැකි ක්‍රියා තුනක් ලියන්න. (ල. 03)

3. ඔබ මීසම තුළ ජන වන්දනා මෙහෙයන් අර්ථවත් කර ගැනීමට කළහැකි යෝජනා 5ක් ලියන්න. (ල. 05)

06. 1. II වන වතිකාන මන්ත්‍රණ සභාව මගින් කිතුණු සභා සමගිය වෙනුවෙන් නිකුත් කළ ප්‍රකාශන 2ක් නම් කරන්න. (ල. 02)

2. කිතුනු සභා එකමුතුව සඳහා මෑත කාලයේදී ගත් පියවර 3 ක් ලියන්න. (ල. 03)

3. පාසල තුළ සාමය වර්ධනය කර ගැනීමට ඔබට ක්‍රියා කළ හැකි ආකාරය කරුණු 5 කින් දක්වන්න. (ල. 05)

07. ඔබ කැමති මාතෘකා දෙකක් පිළිබඳ කෙටි සටහන් ලියන්න.

1. ශුද්ධවූ දෙවන ජුවාම් පාවුලු මුනිතුමා
2. තෙරේසා මව්තුමිය
3. අති උතුම් 14 වන ලියෝ ශුද්ධෝත්තම පියතුමා
4. ජන වන්දනා වර්ෂය

(2x5=10)

PAST PAPERS WIKI
WWW.PastPapers.WiKi

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Papers Library